# මධ්‍යම පරිසර අධිකාරිය
# மத்திய சுற்றாடல் அதிகாரசபை
# Central Environmental Authority

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web: www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. CEA/CHAIR/GEN/2020
ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref.
දිනය / திகதி / Date 28.03.2020

## මාධ්‍ය නිවේදනය

### විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකායේ නියෝගය මත මධ්‍යම පරිසර අධිකාරිය අත්‍යවශ්‍ය සේවා සඳහා යොමු කිරීම.....

2020 මාර්තු 26 වන දින අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද අති විශේෂ ගැසට් නිවේදනයට අනුව පත් කළ විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකායේ නියෝගය මත අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදුකරන ලද ලිඛිත දැනුම්වත් කිරීම්වලට අනුව පහත සඳහන් අත්‍යවශ්‍ය සේවා වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරිය වහාම ක්‍රියාත්මක වන පරිදි අනුයුක්ත කර ඇත.

ඒ අනුව ජනාධිපති කාර්ය සාධක බලකාය මගින් ඉල්ලා ඇති පරිදි පහත සඳහන් රාජකාරී සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන් 2020.03.30 වන දින සිට අනුයක්ත කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු කර ඇත.

1. මහජනතාවට අත්‍යවශ්‍ය පානීය ජලය සපයන, දිවයින පුරා ස්ථාපිත කර ඇති සියලු ජල පවිත්‍රාගාරවල කටයුතු අධීක්ෂණය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සේවයේ නියුතු ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සඳහා යෙදවිය හැකි නිලධාරීන්, දිවයිනේ සියලු දිස්ත්‍රික්ක ආවරණයවන පරිදි, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ඉල්ලීම සහ අවශ්‍යතාව මත රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත. දිවයින පුරා පවතින ජල පවිත්‍රාගාරවල සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම මෙහි අරමුණ වේ.

2. කොරෝනා වෛරසයෙන් ශ්‍රී ලංකාවට බලපා ඇති ව්‍යසනකාරී තත්වය පහව යන තුරු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් කොරෝනා වෛරසය තුරන් කිරීමට ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා දායකත්වය ලබා දීමට, මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇත. මේ අනුව මධ්‍යම පරිසර අධිකාරියේ සේවයේ නියුතු පරිසර නිලධාරීන් ඔවුනට ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉල්ලීම සහ අවශ්‍යතාව මත සේවය ලබාදීම සඳහා යොමුවනු ඇත.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0716566660, 0776252288

එස්. අමරසිංහ
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය